ප්‍රධාන රේගු පරීක්ෂකවරුන් සහ
I වන ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරුන් වෙත

## II වන පන්තියේ සහකාර රේගු අධිකාරී තනතුරට උසස් කිරීම සඳහා පැවැත්වෙන සීමිත තරග විභාගය - 2018

II වන පන්තියේ සහකාර රේගු අධිකාරී තනතුරු පුරප්පාඩුවලින් 15% ක් පිරවීම සඳහා, පහත සඳහන් සුදුසුකම් ඇති,

(අ) ප්‍රධාන රේගු පරීක්ෂකවරුන්ගෙන් හෝ

(ආ) I වන ශ්‍රේණියේ රේගු පරීක්ෂකවරයකු වශයෙන් වසර 02ක සේවා කාලයක් හා තනතුරේ ස්ථිර කර ඇති රේගු පරීක්ෂකවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **වෘත්තීය සුදුසුකම්** :

i. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම සහ එම කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව, පූර්වාසන්න වසර 05 ක් තුළ කාර්ය සාධන ඇගයීම් සාමාන්‍ය මට්ටමේ හෝ ඉන් ඉහළ අගයක් පෙන්නුම් කර තිබීම.

iii. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත්වී තිබීම.

02. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 09 තෙක් පළමුවන පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් සිය අංශ ප්‍රධානියා මඟින් **2018.08.31** වැනි දින හෝ ඊට පෙර අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්) වෙත ලැබෙන සේ එවිය යුතුය. විභාග ගාස්තුව රු. 500.00 කි. එම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ එහි දාරයකින් ඇලවිය යුතුය. මුදල් ගෙවූ රිසිට්පතේ ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම ඉතා යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.

03. මෙම විභාගය "ලිඛිත පරීක්ෂණය" හා "සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය" වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයයට පිරිනමනු ලබන ලකුණු ප්‍රමාණය හා ලැබෙන කාලය පහත දැක්වේ.

**1 වැනි කොටස**

| ලිඛිත පරීක්ෂණය | ලකුණු |
|---|---|
| 01. රේගු පරිපාටිය (පැය 02යි) | 100 |
| 02. සරල ගණිතය (පැය 01යි) | 100 |

**2 වැනි කොටස -** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)
තනතුරට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා

විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යය තුනෙන්ම පවත්වනු ලැබේ. අයදුම්කරුවකු විසින් මුළු විභාගයටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යයේ වෙනසක් සිදු කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන් තමන් එම සේවයට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැක. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

04. මෙම විභාගයේ විෂයයන්ට අදාළ විෂය නිර්දේශ පත්‍රය පහත දැක්වේ.
රේගු පරිපාටිය ප්‍රශ්න පත්‍රයට අයත් විෂය නිර්දේශය.

i. (අ) නැව් බඩු/ ගුවන් බඩු ගොඩබෑම, ගබඩා කිරීම හා නිෂ්කාශනය කිරීම
(ආ) ආනයන ගුදමක් භාරව කටයුතු කරන සහකාර රේගු අධිකාරී II වන ශ්‍රේණියේ නිලධාරියකුගේ රාජකාරී කටයුතු
(ඇ) නිල්පොත අවසන් කිරීම
(ඈ) මත්පැන් ගුදම භාරව කටයුතු කරන සහකාර රේගු අධිකාරී II වන ශ්‍රේණියේ නිලධාරියාගේ රාජකාරී කටයුතු හා වගකීම්

ii. අපනයන - (අ) නෞකාගත කිරීම සඳහා ලැබෙන නැව් බඩු පිළිබඳ අනුගමනය කරන ක්‍රියා පරිපාටිය
(ආ) අපනයන විස්තර පරීක්ෂා කිරීම
(ඇ) තොග පොත සකස් කිරීම

iii. සංක්‍රමණික බඩු - (අ) නැව් බඩු තැන්පත් කිරීම හා නෞකාගත කිරීම
(ආ) සංක්‍රමණික නැව්බඩු ලේඛනය සකස් කිරීම
(ඇ) වෙරළබඩ නෞකාගත කිරීම

iv. බැඳි ගුදම්වලට අදාළ භාණ්ඩ නිෂ්කාශන ක්‍රියාවලිය

v. සාමාන්‍ය - ආපසු ගෙවීම සහ එම ආපසු ගෙවීම් අනුමත කිරීම සඳහා වූ කොන්දේසි

තීරු ගාස්තු ආපසු ලබා ගැනීම සඳහා බලපාන රෙගුලාසි, තහනම් කරන ලද හා සීමා කරන ලද භාණ්ඩ වගුව - දිවයින තුළට හා දිවයිනෙන් පිටතට

රේගු ආඥා පනත යටතේ භාණ්ඩ පිළිබඳ ප්‍රකාශයක් නොකිරීම, වැරදි ප්‍රකාශයක් කිරීම හෝ අඩුවෙන් මිල ගණන් දැන්වීම පිළිබඳ කටයුතු කිරීම සඳහා දී ඇති බලතල

සෝදිසි කිරීම හා අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් රේගු ආඥා පනතේ නියම කොට ඇති ක්‍රියා මාර්ග

හොරෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට එරෙහිව කටයුතු කිරීම ගැන රේගු ආඥා පනතේ නියම කොට ඇති විධිවිධාන, නිලධාරීන්ගේ රාජකාරී කටයුතුවලට බලපාන සියලුම දෙපාර්තමේන්තු නියෝග

05. "සරල ගණිතය" ප්‍රශ්න පත්‍රයට අයත් විෂය නිර්දේශය පහත දැක්වේ.

අයදුම්කරුගේ එකතු කිරීම, අඩු කිරීම, වැඩි කිරීම හා බෙදීම ආදී ගණිතමය හැකියාව මැනීම, සාමාන්‍ය ගණිතමය ගැටලු නිරාකරණයේ වේගය මැනීම, ගණිතමය ගැටලු විසඳීමේ බුද්ධිමය හැකියාව හා තර්කනය පිළිබඳ හැකියාව මැනීම සඳහා සරල අංක ගණිතමය ප්‍රශ්න පත්‍රයකි.